සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය **නාට්‍ය හා රංගකලාව - I** කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

- පහත දැක්වෙන සංවාද ඛණ්ඩ ඇසුරින් අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A සිය රටට යාම සඳහා ඔබතුමාගෙන් සමුගන්නට පැමිණියෙමි. රාජගුරුතුමාණෙනි.
B ගුරුන්නාන්සේ මේක නම් නිකම් කණ්ණාඩියක් නොවේ. මේක අලිබලන කණ්ණාඩියක්.
C හතේ මං වගේ පව්කාරයෙක්. මෙහෙම ජීවත් වෙලා ඇති පලේ මොකක්ද හැමදාම?
D ඔවුන්නක් හිස දැරීම හරිම අවාසනාවන්ත දෙයක්. මම තොපට ඊර්ෂ්‍යා කරමි.
E මට හංගන්න දෙයක් නැහැ. ඒ දරුවවත් ඔහේගේ නෙවෙයි. දැන් බලන කොට කවුද වඳ? ඔහේද? මමද?

01. ජනකතා ආශ්‍රයෙන් නිර්මාණය වූ නාට්‍යයක සංවාද ඛණ්ඩය වන්නේ,
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

02. අනුවර්තන නාට්‍යයක ඇතුළත් සංවාද ඛණ්ඩය වන්නේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

03. වේදිකා නාට්‍ය කලාවේ සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි නාට්‍යයක ඇතුළත් සංවාද ඛණ්ඩය වන්නේ,
(1) A ය. (2) C ය. (3) D ය. (4) D ය.

04. ඓතිහාසික කතා පුවතක් පදනම් කරගත් නාට්‍යයක ඇතුළත් සංවාද ඛණ්ඩය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

05. ශාන්තිකර්මයක එන නාට්‍යමය පෙළපාලියක ඇතුළත් සංවාද ඛණ්ඩය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

- නිවැරදි පිළිතුරු සපයන්න.

06. අභිනය පිළිබඳ ප්‍රථමයෙන් සඳහන් වූයේ,
(1) නාට්‍ය ශාස්ත්‍රයෙහි ය. (2) කාව්‍ය ශාස්ත්‍රයෙහි ය.
(3) හින්දු පුරාණ ග්‍රන්ථයෙහි ය. (4) දසරූප ග්‍රන්ථයෙහි ය.

- පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරින් 07 සහ 08 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A සිදුවීම් හා අවස්ථා සිතින් මවාගෙන රසවිඳිය හැක.
B තෝරාගත් සිද්ධියක් හෝ අවස්ථාවක් තේමාකරගනී.
C අසා රසවිඳීමට හැකි සිද්ධිමාලාවකි.
D කාලානුරූපීව පෙළගස්වා ඇත.
E ව්‍යංගාර්ථයක් සහිත යටිපෙළ අරුතක් තිබේ.
F වර්තමාන කාලයේ සිදුවන ක්‍රියා ලෙස දක්වයි.

07. ඉහත ප්‍රකාශ අතුරින් කතන්දරය හා සම්බන්ධ වන්නේ,
(1) A, B හා C ය. (2) A, C හා D ය. (3) B, C හා F ය. (4) C, D හා F ය.

08. ඉහත ප්‍රකාශ අතුරින් නාට්‍ය පෙළ හා සම්බන්ධ වන්නේ,
(1) A, D හා E ය. (2) D, E හා F ය. (3) B, E හා F ය. (4) A, C හා D ය.

- **අංක 09 සිට 11 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර සපයන්න.**

09. නාට්‍යයක් සිනමා කෘතියකින් වෙනස් වන්නේ,
    (1) එය සජීවී දෘශ්‍ය මාධ්‍යයක් නිසාය. (2) ප්‍රේක්ෂකයන් පිරිසක් උදෙසා නිර්මාණය වූ නිසාය.
    (3) ජීවිතයේ අනුකරණයක් වූ නිසාය. (4) විශේෂ ස්ථානයකට ගොස් නැරඹිය යුතු නිසාය.

10. නාට්‍ය පෙළෙහි අර්ථකථනය ප්‍රේක්ෂකයා වෙත ගෙන යාමේ දී බෙහෙවින් වැදගත් වන්නේ,
    (1) රංගාලෝකයයි. (2) රූපණයයි.
    (3) රංගභූමි අලංකරණයයි. (4) සංගීතයයි.

11. - රිද්මයානුකූල අංග චලන භාවිත කරයි.
    - අර්ථය රහිත වූ නර්තනය යොදා ගනියි.

    ඉහත ප්‍රකාශයන් හා සම්බන්ධ වන්නේ,
    (1) මුද්‍රා නාට්‍ය, ශිවපාර්වතී නර්තනය, වඩිගපටුන (2) රාම සීතා නර්තනය, ලී කෙලි, භරත නාට්‍යම්
    (3) වන්නම්, ලී කෙලි, මුද්‍රා නාට්‍ය, (4) වෙස් නර්තනය, කළගෙඩි නැටුම්, වන්නම්

- **පහත සඳහන් තොරතුරු ආශ්‍රයෙන් අංක 12 සිට 16 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| A | ක්ෂණිකව ක්‍රියාත්මකවීම | F | පංචේන්ද්‍රිය | K | නිදහස් අවකාශය |
| B | නාට්‍යෝචිත අවස්ථා | G | චරිත | L | අනුමත ආලේපන |
| C | අභ්‍යන්තරික ප්‍රකාශන | H | ජය, පරාජය | M | සංවාද හා රංග විධාන |
| D | ගණිතමය රටාව | I | පසුබිම් වාදනය | N | අවධානය |
| E | අඳුර හා එළිය | J | සතතාභ්‍යාසය | O | වර්ණ හා රේඛා |

12. රූපණය හා සම්බන්ධ වන්නේ,
    (1) A, G හා L ය. (2) B, D හා O ය. (3) C, F හා J ය. (4) D, F හා K ය.

13. රංග ක්‍රීඩා හා සම්බන්ධ වන්නේ,
    (1) A,D හා J ය. (2) A, H හා N ය. (3) B, G හා I ය. (4) D, M හා O ය.

14. තාලානුකූල චලන හා සම්බන්ධ වන්නේ,
    (1) B, F හා L ය. (2) C, J හා M ය. (3) D, I හා K ය. (4) E, H හා N ය.

15. පෙළ රචනය හා සම්බන්ධ වන්නේ,
    (1) E, K හා N ය. (2) D, H හා J ය. (3) C, E හා I ය. (4) B, G හා M ය.

16. අංගරචනය හා සම්බන්ධ වන්නේ,
    (1) L, H හා J ය. (2) E, L හා O ය. (3) B, K හා N ය. (4) D, G හා I ය.

- **පහත දක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් අංක 17 සිට 19 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



''ක''



''ග''

17. මෙම ඡායාරූපවලින් දක්වෙන නාට්‍යකරුවන් පිළිවෙලින් සඳහන් වේ.
    (1) හෙන්රි ජයසේන හා පරාක්‍රම නිරිඇල්ල ය.
    (2) දයානන්ද ගුණවර්ධන හා බන්දුල ජයවර්ධන ය.
    (3) සුගතපාල ද සිල්වා හා හෙන්රි ජයසේන ය.
    (4) ගුණසේන ගලප්පත්ති හා සයිමන් නවගත්තේගම ය.

18. ''ක'' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරුගේ නාට්‍ය නිර්මාණ වන්නේ,
   (1) මූදු පුත්තු, සඳ කිඳුරු හා පිංගුත්තර ය.
   (2) මකරා, පුස්ලෝඩං හා සකලජන ය.
   (3) පව්කාරයෝ, ජනේලය හා තවත් උදෑසනක් ය.
   (4) දැවැද්දෝ, හරිම බඩු හයක් හා තට්ටුගෙවල් ය.

19. ''ග'' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු හා සම්බන්ධ සත්‍ය ප්‍රකාශය වන්නේ,
   (1) මරාසාද් නාට්‍යය ඔහුගේ නිර්මාණයකි.
   (2) ජන කරළිය, ජංගම රඟමඬල ආරම්භ කරන ලදී.
   (3) උත්තමාවී නාට්‍යය පරිවර්තනය කරන ලද්දේ ඔහු විසිනි.
   (4) ඔහු ප්‍රවීණත්වයක් දක්වනු ලබන්නේ නාට්‍ය ක්ෂේත්‍රයට පමණි.

- **අංක 20 සිට 24 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.**

20. නාට්‍යමය අවස්ථාවක් යනු,
   (1) නාට්‍යයේ ආරම්භක අවස්ථාවයි.
   (2) ප්‍රේක්ෂකයා තුළ කුතුහලය හා අවිනිශ්චිත බව ඇති කරවන අවස්ථාවයි.
   (3) ප්‍රධාන නළුවා වේදිකාවට පැමිණෙන අවස්ථාවයි.
   (4) සංවාද භාවිතය අඩුවෙන් යොදා ගන්නා අවස්ථාවයි.

21. සරල අංග රචනය යනු,
   (1) බාහිර ස්වරූපය තිබෙන අයුරින්ම සැකසීමයි. (2) චරිතය අනුව සකස් කිරීමයි.
   (3) බාහිර ස්වරූපය වෙනත් ආකාරයකට රචනා කිරීමයි. (4) නිර්මාණාත්මක ලෙස අංග සැකසීමයි.

22. නිර්මිත චලනය යනු,
   (1) නිශ්චිත රටාවකට අනුව සිදුකරනු ලබන චලන රටාය.
   (2) පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදන කරන චලන රටාය.
   (3) ආයාසයකින් තොරව සිදුකරනු ලබන චලන රටාය.
   (4) ගණිතමය රටාවකට අනුව යෙදෙන චලන රටාය.

23. රූපණය යනු,
   (1) චරිතයකට ක්ෂණිකව ආරූඪ වීමයි.
   (2) චරිතයකට අදාළ සංවාද උච්චාරණය කිරීමය.
   (3) චරිතයකට ආරෝපණය වී යම්කිසි කාල සීමාවක් එහි ජීවත්වීමයි.
   (4) චරිතයකට ප්‍රවේශවීමට සතතාභ්‍යාසයේ යෙදීමයි.

24. එසැණ නිරූපණය යනු,
   (1) සංවාද වලින් තොරව යම් අවස්ථාවක් කතාන්දරයක ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමයි.
   (2) සැලසුමකින් හෝ පිටපතකින් තොරව සිද්ධියක් අවස්ථාවක් ක්ෂණිකව නිරූපණය කිරීමයි.
   (3) තේමාව ඉස්මතු වන ආකාරයෙන් පමණක් සිදුකරනු ලබන රංගනයයි.
   (4) යම් කිසි සිද්ධියක් සතර අභිනය යොදා ගනිමින් වේදිකාවක ඉදිරිපත් කිරීමයි.

- **පහත සඳහන් තොරතුරු හා ඡායාරූප ආශ්‍රයෙන් අංක 25 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A B C D E



25. 'A' ඡායාරූපයෙන් දැක්වෙන රංගන ශිල්පිනිය වන්නේ,
   (1) රත්නා ලාලනී ජයකොඩි ය. (2) සෝමලතා සුබසිංහ ය.
   (3) මානෙල් ජයසේන ය. (4) කෞශල්‍යා ප්‍රනාන්දු ය.

26. ''කෝරළේ මහත්තයා'' ලෙස ජනප්‍රිය වූ රංගන ශිල්පියා දැක්වෙන්නේ,
   (1) 'A' හි ය. (2) 'C' හි ය. (3) 'D' හි ය. (4) 'E' හි ය.

27. 'D' ඡායාරූපයෙන් දක්වෙන්නේ,
(1) ලලිතා සරච්චන්ද්‍රය. (2) කෞශල්‍යා ප්‍රනාන්දුය. (3) සෝමලතා සුබසිංහය. (4) මානෙල් ජයසේනය.

28. ඉංග්‍රීසි නාට්‍ය සඳහා රංගනයෙන් දායක වූ ශිල්පියෙකු දක්වෙන්නේ,
(1) 'C' හි ය. (2) 'B' හි ය. (3) 'E' හි ය. (4) 'D' හි ය.

29. 'මනමේ කුමරුගේ' චරිතයට පණ පොවමින් දීර්ඝ කාලයක් කරළියේ රැඳී රංගන ශිල්පියා දක්වෙන්නේ,
(1) 'D' හි ය. (2) 'A' හි ය. (3) 'B' හි ය. (4) 'C' හි ය.

30. නාට්‍ය අධ්‍යක්ෂණයේ නියැළෙන රංගන ශිල්පියෙක් හා ශිල්පිනියක් පිළිවෙළින් දක්වෙන්නේ,
(1) A හා B හි ය. (2) E හා D හි ය. (3) A හා C හි ය. (4) B හා D හි ය.

- **පහත සඳහන් තොරතුරු ආශ්‍රයෙන් අංක 31 සිට 35 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| A | කපු ගස | F | පනාව | K | කපු කටින යන්ත්‍රය |
| B | නානු ගෑම | G | සළුවක් විවීම | L | පන්දම් පාලිය |
| C | වැදියක්පාලිය | H | කුඩය | M | අනුකරණය |
| D | බුලත් විට කෑම | I | සමාරෝපය | N | කළු කණ්නාඩි |
| E | සංවාද භාවිතය | J | ව්‍යාජ පාලි වචන කථා කිරීම | O | කෙණ්ඩිය |

31. ''පාලි දොළහ'' නාට්‍යමය අවස්ථාව හා සම්බන්ධ වන්නේ,
(1) A, G හා K ය. (2) B, I හා M ය. (3) C, L හා O ය. (4) D, J හා N ය.

32. ''කපුයක්කාරිය'' නාට්‍යමය අවස්ථාව හා සම්බන්ධ වන්නේ,
(1) D, F හා N ය. (2) C, H හා O ය. (3) B, L හා M ය. (4) A, G හා K ය.

33. ''නානුමුරය'' නාට්‍යමය අවස්ථාව හා සම්බන්ධ වන්නේ,
(1) A, E හා G ය. (2) B, D හා F ය. (3) C, F හා K ය. (4) D, J හා O ය.

34. ''වඩිගපටුන'' නාට්‍යමය අවස්ථාව හා සම්බන්ධ වන්නේ,
(1) H, J හා N ය. (2) D, G හා L ය. (3) I, K හා O ය. (4) F, H හා M ය.

35. නාට්‍යමය අවස්ථාවලට පොදු ලක්ෂණ හා සම්බන්ධ වන්නේ,
(1) A, D හා J ය. (2) C, G හා K ය. (3) E, I හා M ය. (4) H, L හා O ය.

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.**

36. ''රංග භූමිය'' හා නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) රංග භූමිය එළිමහන් හා ගෘහස්ථ වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි.
(2) ඇතැම් රංග භූමි තුළ කැරකෙන වේදිකා දක්නට ලැබේ.
(3) රංග භූමියේ භූගෝලීය බෙදීම මනඃකල්පිතය.
(4) ඇරීනා රංග භූමිය, ආරුක්කු වේදිකාව ලෙස ද හඳුන්වයි.

37. ''ප්‍රේක්ෂකයා'' හා නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) නාට්‍යය නරඹා රසවිඳින පුද්ගලයා, ප්‍රේක්ෂකයා වේ.
(2) ප්‍රේක්ෂකයන් සියලු දෙනා තුළ ම සමාන බුද්ධි මට්ටමක් තිබිය යුතු වේ.
(3) ප්‍රේක්ෂකයාගේ ප්‍රතිචාර නාට්‍යයකට ප්‍රයෝජනවත් වේ.
(4) නාට්‍ය නිෂ්පාදනයේ දී ප්‍රේක්ෂකයාට වැදගත් තැනක් හිමි වේ.

38. ආනුෂාංගික කලා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) දෘශ්‍ය මාධ්‍යයට අයත් සියලුම කලාවන් ය.
(2) නළුවා සැරසීමට යොදා ගන්නා කලාවන් ය.
(3) ප්‍රේක්ෂකයා සතුටු කිරීමට භාවිත කරන කලාවන් ය.
(4) නාට්‍යයක් සාර්ථක කර ගැනීමට උපකාරී කරගන්නා කලාවන් ය.

39. අංග රචනයේ දී මුහුණ ප්‍රධාන වශයෙන් කලාප,
(1) නවයකට බෙදනු ලබයි. (2) හතරකට බෙදනු ලබයි.
(3) හයකට බෙදනු ලබයි. (4) දෙකකට බෙදනු ලබයි.

40. පහත A හා B වලින් පිළිවෙළින් දක්වෙන්නේ,

A සිංහබාහු
B මුදුපුත්තු

(1) නාට්‍යධර්මී නාට්‍යයක් හා ලෝකධර්මී නාට්‍යයකි. (2) මිශ්‍ර ශෛලියේ නාට්‍යයක් හා විදේශීය නාට්‍යයකි.
(3) ශෛලීගත නාට්‍යයක් හා වීථි නාට්‍යයකි. (4) නාට්‍යධර්මී නාට්‍යයක් හා මුද්‍රා නාට්‍යයකි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016
# නාට්‍ය හා රංගකලාව - II

**10 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

---

(01) දික්තල කාලගෝල නාට්‍යය නාට්‍ය ධර්මී ශෛලියට අනුව නිර්මාණය වූවකි.

i. මෙහි පෙළ රචකයා කවුරුන් ද? (ලකුණු 02)

ii. මෙම නාට්‍යයේ කතා පුවත සැකෙවින් ලියන්න. (ලකුණු 02)

iii. මෙම නාට්‍යයේ තේමාව කුමක් ද? (ලකුණු 02)

iv. ''දික්තල කාලගෝල නාට්‍යයේ පසුතල අලංකරණය පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 02)

v. මෙම නාට්‍යයේ නාඩගම් සම්ප්‍රදාය දක්නට ලැබෙන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

vi. මෙහි දික්තල හා කාලගෝල අතර සිදුවන ගැටුම විසඳන ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 02)

(02) නාට්‍යයක් රඟදක්වන ඕනෑම ස්ථානයක රංග භූමියක් වශයෙන් හැඳින්වේ.

i. රංගභූමිය හැඳින්වීම සඳහා යොදන තවත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

ii. රංගභූමියක තිබිය යුතු මූලික ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. අතීතයේ ගිනිමැල භූමියේ සිට නූතන වේදිකාව දක්වා රංග භූමියේ විකාශනය සිදුවී ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) නාට්‍යයක් යනු සාමූහික ක්‍රියාවලියකි,

i. ''නාට්‍ය පෙළ'' යන්න හඳුන්වන්න. (ලකුණු 03)

ii. නාට්‍යයක් සාර්ථක කර ගැනීම සඳහා සහාය වන ශිල්පීන් හතර දෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

iii. නාට්‍යමය පෙළක් රංගයක් බවට පත්කිරීමේ පියවර මොනවා ද? (ලකුණු 05)

(04) නාට්‍ය නිර්මාණයේ දී නිර්මාණකරුවා තම තේමාවන් සඳහා ඓතිහාසික සිදුවීම් / චරිත පාදක කරගනු ලබයි.

i. එවැනි නිර්මාණ සඳහා මූලාශ්‍රයන් සපයා ගත හැකි ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ලකුණු 03)

ii. ඓතිහාසික සිදුවීම් / චරිත පාදක කර ගත් නාට්‍ය දෙකක් හා ඒවායේ නිර්මාණකරුවන් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ඓතිහාසික සිදුවීමක් / චරිතයක් ඇසුරෙන් නාට්‍යයක් නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 05)

The National e-learning Portal - The General Education

(05) i. රංගභාණ්ඩ යනු මොනවාදැයි හඳුන්වන්න. (ලකුණු 03)

ii. රංගභාණ්ඩ නිර්මාණ ශිල්පියාගේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 04)

iii. රංගන කාර්යය සාර්ථක කරගැනීමට රංගභාණ්ඩ උපකාරී වන අන්දම උදාහරණ දෙමින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(06) ශ්‍රව්‍ය දෘශ්‍ය කලාවන් අතර ප්‍රමුඛතාවයක් නාට්‍ය කලාවට හිමි වේ.

i. නාට්‍ය පිළිබඳව දක්වෙන නිර්වචන දෙකක් නිවැරදිව දක්වන්න. (ලකුණු 03)

ii. ශ්‍රව්‍ය දෘශ්‍ය වුවද ''නෘත්‍ය'' ''නාට්‍යය'' හා සමාන නොවේ. පැහැදිළි කරන්න. (ලකුණු 04)

iii. සජීවී කලාවක් ලෙස වේදිකා නාට්‍යය සුවිශේෂී වීමට හේතු විමසන්න. (ලකුණු 05)

(07) රංග ක්‍රීඩා මෙන්ම රංග අභ්‍යාස ද, නළු කාර්යයේ යෙදෙන්නන්ට අත්‍යවශ්‍ය වේ.

i. පන්ති කාමරයේදී ඔබ ප්‍රායෝගිකව සිදුකරනු ලැබූ රංග අභ්‍යාස තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii. සාමාන්‍ය ක්‍රීඩාවකින්, රංග ක්‍රීඩා වෙනස් වන ආකාරය පැහැදිළි කරන්න. (ලකුණු 04)

iii. රංග ක්‍රීඩා හා රංග අභ්‍යාසවල යෙදීමෙන් නළුවාට / නිළියට ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 05)

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය **නාට්‍ය හා රංගකලාව** කාලය පැය 01 යි.

## ප්‍රායෝගික පරීක්ෂණය

(01) පෙළ ආශ්‍රිත භාෂණ රංගනය කේවල

පළමුවන කොටස ශිෂ්‍ය / ශිෂ්‍යයාවගේ තෝරා ගැනීම (විනාඩි 02)

10 ශ්‍රේණිය සඳහා නිර්දේශිත නාට්‍ය පෙළෙන්, ශිෂ්‍ය / ශිෂ්‍යයාවන් කලින් සූදානම්ව පැමිණෙන භාෂණ කොටසක් රංගනය සහිතව ඉදිරිපත් කිරීම.

දෙවන කොටස විෂය භාර ගුරුභවතාගේ තේරීම (විනාඩි 02)

දෙන ලද නාට්‍ය පෙළක ඕනෑම සුදුසු ස්ථානයකින්, ගුරු භවතා විසින් තෝරා දෙනු ලබන භාෂණ කොටසක් ඉදිරිපත් කිරීම. (ලකුණු 20)

නිර්දේශිත නාට්‍ය පෙළ තලමල පිපිලා

සැලකිය යුතුයි : මෙම ඇගයීමෙහි එක් කොටසක් සඳහා ලකුණු 20 ක් හිමිවන අතර, කොටස් දෙකෙහිම ලකුණු එකතුව දෙකෙන් බෙදා, ඇගයීමේ අවසාන ලකුණ සකස් කර ගන්න.

(02) ක්ෂණික නිරූපණය කේවල

විනාඩි 03 ක උපරිමයකට යටත් ව දෙන ලද චරිතයක සිද්ධියක් / අවස්ථාවක් නාට්‍යානුසාරීව ගොඩනංවමින් එසැණින් නිරූපණය කර පෙන්වීම. (ලකුණු 15)

සැලකිය යුතුයි : සුදුසු මාතෘකා විෂයය භාර ගුරු භවතා විසින් සපයා ගත යුතුයි.

(03) ක්ෂණික නිරූපණය සාමූහික

විනාඩි 08 ක උපරිමයකට යටත්ව දෙන ලද මාතෘකාවට අනුව නාට්‍යමය අවස්ථාවක් ගොඩනැගිය යුතුවේ. (ලකුණු 20)

සැලකිය යුතුයි : ශිෂ්‍ය / ශිෂ්‍යාවන් 04 07 අතර සංඛ්‍යාවකින් සමන්විත යුතු කණ්ඩායම් ඇගයීමකි. සුදුසු මාතෘකා විෂයය භාරගුරු භවතා විසින් සපයා ගත යුතුය.

(04) නාට්‍ය ගීතය කේවල

නූර්ති සම්ප්‍රදායෙහි පටන් නූතන යුගය දක්වා වන ඕනෑම නාට්‍ය සම්ප්‍රදායකින් / ශෛලියකින් තෝරාගත් ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ යුතුය. (ලකුණු 15)

(05) නිර්මාණාත්මක රංග රචනය සමූහ

සංගීත ඛණ්ඩයක් ප්‍රතිවාදනය කිරීමේදී නාට්‍යානුරූපී රංග වින්‍යාසයකින් යුතු වාචික ප්‍රකාශයෙන් තොර නිර්මාණාත්මක සාමූහික රංගනයක් විනාඩි 02 04 අතර කාල පරාසයකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. (ලකුණු 15)

සැලකිය යුතුයි :
- ශිෂ්‍ය / ශිෂ්‍යයාවන් 03 ක් 05 ත් අතර සංඛ්‍යාවකින් සමන්විත විය යුතු කණ්ඩායම් ඇගයීමකි.
- මෙය පූර්ව සූදානමකින් යුතුව සිදු කළ යුතු රංගනයක් බැවින් සුදුසු සංගීත ඛණ්ඩ කල්තබා ශිෂ්‍ය / ශිෂ්‍යාවන් වෙත සපයා දිය යුතුය.
- සුදුසු සංගීත ඛණ්ඩ විෂයභාර ගුරුභවතා විසින් සපයා ගත යුතුය. (පසුගිය වර්ෂය අ.පො.ස. සා.පෙළ ප්‍රායෝගික පරීක්ෂණ පුහුණුවීම් සඳහා උපකාරී කරගත් සංගීත ඛණ්ඩ හෝ ඔබ විසින් සපයා ගත් සුදුසු සංගීත ඛණ්ඩ හෝ උපයෝගී කරගත හැක.)

(06) කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම කේවල

තමන් කැමති ඕනෑම සම්ප්‍රදායික කතාවක් නාට්‍යානුසාරීව විනාඩි 03 05 ත් අතර කාලයකදී ඉදිරිපත් කළ යුතුය. (ලකුණු 15)

සැලකිය යුතුයි : ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ට තමන් කැමති ඕනෑම කතන්දරයක් තෝරා ගැනීමට අවස්ථාව තිබේ. සුදුසු රංග වස්ත්‍ර, රංග භාණ්ඩ මෙන්ම ස්ථානීය වශයෙන් සපයා ගත හැකි සරල හා අත්‍යවශ්‍යම පසුතල පමණක් භාවිතා කිරීමට හැකිය.

(මුළු ලකුණු 100 යි.)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **අවසාන වාර පරීක්ෂණය 2016**

**10 ශ්‍රේණිය** **නාට්‍ය හා රංගකලාව 1/2**

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(4) | 3 -(1) | 4 -(3) | 5 -(1) | 6 -(1) | 7 -(2) | 8 -(3) | 9 -(1) | 10 -(2) |
| 11-(4) | 12 -(3) | 13 -(2) | 14 -(3) | 15 -(4) | 16 -(2) | 17 -(1) | 18 -(3) | 19 -(2) | 20 -(2) |
| 21-(1) | 22 -(2) | 23 -(3) | 24 -(2) | 25 -(3) | 26 -(4) | 27 -(2) | 28 -(1) | 29 -(3) | 30 -(4) |
| 31-(3) | 32 -(4) | 33 -(2) | 34 -(1) | 35 -(3) | 36 -(4) | 37 -(2) | 38 -(4) | 39 -(3) | 40 -(1) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

**II කොටස**

(01) i. චාර්ලිස් සිල්වා ගුණසිංහ (ලකුණු 02)

ii. නාට්‍යයට අදාළ කතාව නිවැරදිව කෙටියෙන් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 02)

iii. නොගැලපෙන අය තම ජීවිතයට සම්බන්ධ කර ගැනීමේ විපාක හෝ අදාළ ලෙස තේමාව පැහැදිළි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

iv. ● සංවාද හා ගීත මගින් අදාළ පරිසර මැවීම් ● රංගාලෝකය මගින් ගඟ මැවීම (ලකුණු 02)

v. ● පොතේ ගුරු පූර්ණ විරිඳුවෙන් තෙරුවන් නැමැදීම. ● ගායක පිරිස ගයන තෝඩායම ● පූර්ව රංගනයේදී බහුබූත කෝලමා පැමිණීම. ● පොතේ ගුරු විසින් නාට්‍යයේ චරිත හා අවස්ථා ප්‍රේක්ෂකයා හමුවට පැමිණවීම. ● අවසානයේ ගයන මංගලම් සින්දුව.... ආදී අවස්ථා දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 02)

vi. දික්තල, කාලගෝල අතර ගැටුම, එකිනෙකා වෙන වෙනම ගෙන ප්‍රශ්න කර, සත්‍ය වටහාගෙන මහෞෂධ පඬිතුමා විසින් විසඳන ආකාරය සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02) (මුළු ලකුණු 12)

(02) i. රඟ මඬල, රංග පීඨය, වේදිකාව, කරළිය (ලකුණු 03)

ii. ● සමතලා බිමක් වීම ● රඟපෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම ● රංග ශිල්පීන්ට අවශ්‍ය වන අවම පහසුකම්වත් තිබීම ● ප්‍රේක්ෂකයාට පහසුවෙන් නැරඹිය හැකිවනසේ පිහිටා තිබීම... ආදී ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 04)

iii. ගිනිමැල භූමියේ සිට විවිධ අවස්ථාවන් පසු කරමින් වර්තමාන (නූතන) වේදිකාව දක්වා විකාශනය වූ අයුරු පැහැදිළි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

(03) i. නාට්‍යෝචිත අවස්ථාවන් වේදිකාවක රංගගත කිරීමට සුදුසු අයුරින් සකස්කොට ලියන ලද සාහිත්‍ය කොටස නාට්‍ය පිටපතයි. හෝ ඊට ගැලපෙන පිළිතුරක් ලබා දී ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 03)

ii. ආනුෂාංගික ශිල්පීන් හතර දෙනෙකු නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ ආනුෂාංගික ශිල්පීන්ය, ඇතැම් විටෙක සිසුන් නළුවා ප්‍රේක්ෂකයා අධ්‍යක්ෂවරයා ලෙස පිළිතුරු සපයන්නට හැක.) (ලකුණු 04)

iii. තෝරා ගන්නා නාට්‍ය පෙළෙන්, නිෂ්පාදන පිටපත සකසා ගන්නා අයුරු, නළුවරණයේ සිට පාසල් වේදිකාවේ හෝ රැස්වීම් අවස්ථාවක එය රංග ගත කිරීමේ පියවර කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 12)

(04) i. මහාවංශය ඇතුළු මූලාශ්‍ර, උපුටා ගත හැකි වංශකථා, පුරාතන ග්‍රන්ථ, ආදියෙහි නම් තුනක් නිවැරදිව සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

ii. සුභ සහ යස / ස්ත්‍රී / සිංහබාහු / කුවේණි ආදී අදාල නාට්‍යයන් හා ඒවායේ නිර්මාණකරුවන් නිවැරදිව සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

iii. අදාළ සිද්ධියට චරිතයට හානි නොවන අයුරින් නාට්‍යෝචිත අවස්ථා තෝරා ගැනීම, එයට උචිත අයුරින් චරිත හා සංවාද ගොඩනැගීම, වර්තමාන සමාජයට අවශ්‍ය ආදර්ශයන් ඉස්මතු වන අයුරින් නිර්මාණය කිරීම ආදී කරුණු විස්තරාත්මකව දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 12)

(05) i. රංගනයේ දී නළු නිළියන් විසින් භාවිත කරනු ලබන සහ වේදිකාවේ භාවිත කරන විවිධ භාණ්ඩ රංග භාණ්ඩ නමින් හැඳින්වේ. (ලකුණු 03)

ii. පිටපත හොඳින් කියවා, නාට්‍යයට රංගෝපකරණ අවශ්‍ය නම් පමණක්, රංගය හා මනා ලෙස සම්බන්ධ විය යුතු හා එයට බාධා නොවන අයුරින්, තම නිර්මාණාත්මක හැකියාවන් උපයෝගී කරගෙන, රංග භාණ්ඩ නිර්මාණය කරන ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 04)

iii. රූපණ කාර්යයට රංග භාණ්ඩ උපකාරී වන අන්දම උදාහරණ සපයමින් පැහැදිළි කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 12)

(06) i. අදාළ නිර්වචන නිවැරදිව පුද්ගල නාමයන් හා ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 03)

ii. නෘත්‍ය හා නාට්‍ය අතර ඇති වෙනස්කම් පිළිබඳ සංසන්දනාත්මකව සාකච්ඡා කිරීම මෙම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ. (අභිනය භාවිතය, කතා පුවතක් පාදක කරගැනීම ආනුෂාංගික අංග භාවිතය, නාට්‍ය පෙළ කතා වින්‍යාසය ආදී ලක්ෂණ නෘත්‍ය හා නාට්‍යයේ දී භාවිතා වන ආකාරය.) (ලකුණු 04)

iii. නාට්‍යයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ (නාට්‍ය පෙළ, ප්‍රේක්ෂක සහභාගිත්වය, සතර අභිනය ආනුෂාංගික කලා ආදී....) පිළිබඳ විස්තර කර තිබේනම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 12)

The National e-learning Portal for The General Education